**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායකයන් සඳහා වන ළමා ආරක්ෂාව පිළිබඳ ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන**

ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම ,කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම අරමුණුකර ගත් විශේෂයෙන් නිර්මාණය කරන ලද වැඩසටහනක් වන ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන ***ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක්*** පාසල තුළ නිර්මාණය කිරීම සඳහා ශිෂ්‍ය නායකයන්ගේ මූලිකත්වයෙන් සිදුකිරීමට අපේක්ෂිතය. ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ශිෂ්‍ය නායකයින් දැනුවත් කිරීම, පාසල තුළ ළමා අපයෝජන සිදුවීම් අවම කරගැනීම සහ වළක්වා ගැනීමට ශිෂ්‍ය නායකයින්ගේ දායකත්වය ලබා ගැනීම, ශිෂ්‍ය නායකයින් ළමා ආරක්ෂාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගිකරවා ගැනීම, පාසල තුළ ළමා හිතකාමී සහ ආරක්ෂාකාරී පරිසරයක් ඇතිකිරීමට ශිෂ්‍ය නායකයන්ගේ නායකත්වය ඇතුළු දැනුම,කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම සඳහා මැදිහත්කරණය සහ ළමා ආරක්ෂාවේ වගකීම සහ වගවීම දරන ශිෂ්‍ය නායක ප්‍රජාවක් බිහිකිරීම සඳහා දායකත්වය ලබාදීම මෙම වැඩසටනේ ප්‍රධාන අරමුණුවේ.

එම අරමුණු ළඟාකර ගැනීම සඳහා පාසල තුළ ක්‍රියාත්මක කලයුතු වැඩසටහන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සකස්කර ඇත. මෙම ක්‍රියාකාරකම් දක්වා ඇති පිළිවෙලින් පාසල තුළ ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ.

<u>පාසල තුළ ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන</u>

**1. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිළිබඳ සන්නිවේදන තොරතුරු ප්‍රදර්ශනය කිරීම**

ශිෂ්‍ය තානාපති පාසලක් ලෙස ලියාපදිංචි පාසල් සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශිෂ්‍ය තානාපති පාසලක් ලෙස සහතික කර නිකුත්කරන ලද සහතිකය විදුහල්පති නිල කාමරයේ ප්‍රදර්ශනය කලයුතුය.

- ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ලිපිනය ප්‍රදර්ශනය කිරීම
- 1929 ළමා උපකාරක දුරකතන සේවය පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කිරීම.
- ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් / ප්‍රාදේශිය නිලධාරීන්ගේ තොරතුරු ප්‍රදර්ශනය(නම, තනතුර,දුරකථන අංකය)

ඉහත තොරතුරු පාසල් සිසුන්ට සහ ගුරුවරුන්ට දැකගැනීමට **පහසු ස්ථානයක** ප්‍රදර්ශනය කළ යුතුය. විදුහල්පති කාමරය, ශිෂ්‍ය නායක මණ්ඩල කාමරය, පුස්තකාල පරිශ්‍රය,උපදේශන කාමරය, ප්‍රධාන දැන්වීම් පුවරුව/ දැන්වීම් පුවරු වල ප්‍රදර්ශනය කල යුතුය. එසේම මෙම තොරතුරු වාර්ෂිකව යාවත්කාලීන කලයුතුය.

**2. ශිෂ්‍ය තානාපති "ලොග් සටහන්" පොතක් පවත්වාගෙන යාම**

සෑම පාසලකම "ශිෂ්‍ය තානාපති ලොග් සටහන් පොත" ප්‍රධාන ශිෂ්‍ය නායකයා/ශිෂ්‍ය නායිකාව විසින් පවත්වාගෙනයාම කලයුතුය. මෙහිදී සෑම ලොග් සටහනක් අවසානයේම ශිෂ්‍ය නායක මණ්ඩලභාර ගුරුවරයා/වරිය සහ පාසලේ විදුහල්පතිතුමා/තුමිය අත්සන සහ දිනය යෙදිය යුතුය.

ශිෂ්‍ය තානාපති පාසල් ඇගයීම් සිදුකරන අවස්ථාවේදී මෙම ලොග් සටහන් අනිවාර්යයෙන් සැලකිල්ලට ගනු ලැබේ. ලොග් සටහන් යෙදීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් ( අමාත්‍යාංශ, පළාත්, කලාප, කොට්ඨාස) ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්( ප්‍රාදේශීය ,දිස්ත්‍රික්, ප්‍රධාන කාර්යාලය) සහ ඔබ පාසලට අනියුක්ත කරන ලද විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපතිවරු සඳහා සටහන් යෙදිය හැක. තවද වැඩසටහන සඳහා සම්බන්ධ කරගනු ලබන සම්පත් දායකයන්, අනුග්‍රාහක භවතුන් සහ සුබපතන්නන් සඳහාද ලොග් සටහන් යෙදීමට අවස්ථාව ලබාදිය හැකිය.

**3. ශිෂ්‍ය නායකයින් සඳහා ක්‍රියාත්මක "පාසල් ශිෂ්‍ය තානාපති වැඩමුළුව"**

මෙම වැඩමුළුව පාසල නියෝජනය කරන ශිෂ්‍ය තානාපතිවරු 5 දෙනාගේ නායකත්වයෙන් සහ 9 වන ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා සියළුම ශිෂ්‍ය නායකයන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වියයුතුය. ශිෂ්‍ය නායක මණ්ඩලභාර ගුරුතුමා/තුමියගේ මෙහෙයවීමෙන් සහ උපදේශන ගුරුතුමා/තුමිය, පාසල් ළමා ආරක්ෂක කමිටුභාර ගුරුතුමා/තුමිය, තොරතුරු තාක්ෂණ විෂයභාර ගුරුතුමා/ගුරුතුමිය, මාධ්‍ය විෂයභාර ගුරුතුමා/ ගුරුතුමියගේ සහය සහ සහභාගිත්වය ලබා ගතයුතුය.දින තීරණය කිරීම විදුහල්පතිවරයා/වරියගේ අනුමැතිය පරිදි කළයුතුය. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් /විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපතිවරුන් / බාහිර සම්පත්දායකයින් සම්බන්ධ කරගනිමින් මෙම වැඩසටහන සිදුකල යුතුය.

මෙහිදී ළමා ආරක්ෂාව සහ ළමා අපයෝජන, ළමා සහභාගිත්වය, ළමා අයිතීන් ඇතුළු පාසලේ ළමුන් මුහුණ දෙන අභියෝග සඳහාත් සහ ළමා ආරක්ෂාව සඳහාත් ශිෂ්‍ය නායක වගකීම සහ භූමිකාව යන ආදිය වැඩසටහන් අන්තර්ගතයට ඇතුලත් විය යුතුය. පාසල තුළ ශිෂ්‍ය තානාපති වැඩසටහන පිළිබඳ සාකච්ඡා කිරීම සහ ශිෂ්‍ය නායකයන් සඳහා ළමා ආරක්ෂාවට අදාල ආචාර ධර්ම පද්ධතියක් සකසා ගතයුතුය.

**4. ශිෂ්‍ය නායකයන් සඳහා වන "පාසල් ළමා ආරක්ෂක කඳවුර" පැවැත්වීම**

පාසලේ විදුහල්පති තුමාගේ /තුමියගේ නායකත්වය හා මග පෙන්වීම මත වර්ෂයකට එක්වරක් පාසල් පරිශ්‍රය තුළ එක් දිනක හෝ දින කිහිපයක වැඩසටහනක් ලෙස සුදුසු පරිදි මෙම වැඩසටහන පැවැත්විය යුතුය.

ශිෂ්‍ය නායක මණ්ඩල භාර ගුරුවරුන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගත යුතු අතර ශිෂ්‍ය තානාපතිවරු, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක නායිකාවන්ගේ සහභාගිත්වයෙන් මෙම කඳවුර පැවැත්වියයුතුය.

මෙම කටයුත්ත ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්/ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන්ගේ සහය ලබාගනිමින් සිදුකලයුතුය. විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපති වැඩසටහන යටතේ ලියාපදිංචිවූ විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපතිවරුන්ගේ සහාය ලබාගැනීම කළහැකිය.

1. ළමා ආරක්ෂාව පිළිබඳ පාසලේ ළමුන් මුහුණ දෙන ගැටළු සාකච්ඡා කිරීම
2. කණ්ඩායම් ගත ඉදිරිපත්කිරීම, ගැටළු සඳහා ශිෂ්‍ය නායකයන් විසින් දෙන විසඳුම් යෝජනා කිරීම
3. එම ගැටළු විසඳීමට ප්‍රායෝගික විසඳුම් සාකච්ඡා කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

පුවත්පත් හෝ විද්‍යුත් මාර්ගයෙන් පසුගිය මාස 6 තුළ වාර්තාවන ලද ළමා අපයෝජන සිදුවීම් හා ළමා අපචාර පිළිබඳ සිද්ධි කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කිරීම හා එම සිද්ධීන් තමන්ට හෝ තම පාසලේ සිසුවෙකුට හෝ සිසුවියකට සිදුවූයේ නම් හෝ සිදුවන්නේ නම් කටයුතු කළයුතු ආකාරය ගැන සාකච්ඡාවක් සිදුකිරීම ඇතුළු නිර්මාණශීලීව පාසල් ළමා ආරක්ෂක කඳවුරු ප්‍රතිඵලදායක අයුරින් පැවැත්වීමට පියවර ගතයුතුය.

පාසලේ ශිෂ්‍ය නායක මණ්ඩලය, පාසල් සිසුන්, දෙමව්පියන් , ආදි ශිෂ්‍යයන්, අනුග්‍රාහක භවතුන් සහ සුබපතන්නන්ගේ සහය ලබා ගනිමින් කටයුතු කිරීමට පාසලට හැකියාව ඇත.

**5. ළමා ආරක්ෂාව පිළිබඳ <u>ශිෂ්‍ය</u> සම්මන්ත්‍රණය / වැඩමුළුව / දැනුවත්කිරීමේ වැඩසටහන**

ළමයින්ගේ අපයෝජන,අපචාර සහ ළමා අයිතීන් කඩවීම පිළිබඳ ගැටළු සඳහා දැනුවත් කිරීමක් හෝ සම්මන්ත්‍රණයක් විදුහල්පතිතුමා/තුමියගේ නායකත්වය යටතේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායකයන්ගේ සහභාගිත්වයෙන් සංවිධානය කළ යුතුය. අවශ්‍ය නම් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් /විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපතිවරුන් / බාහිර සම්පත්දායකයින් සම්බන්ධ කරගනිමින් මෙම වැඩසටහන සිදුකල යුතුය.

- **1-5 ශ්‍රේණි**
- **6-8 ශ්‍රේණි**
- **9-11 ශ්‍රේණි**
- **12-13 ශ්‍රේණි**

**පාසලකට අවම වශයෙන් එක් එක් ශ්‍රේණි සඳහා වර්ෂයකදී එක් වැඩසටහනක් කලයුතුය.**

**6. ළමා ආරක්ෂාව පිළිබඳ ගුරු සම්මන්ත්‍රණය / වැඩමුළුව / දැනුවත්කිරීමේ වැඩසටහන**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යනු කුමක්ද හා ඉන් සිදුවන සේවාව , ළමයින්ට බලපාන නීති, වර්තමාන ළමුන් මුහුණ දෙන ගැටළු සහ අභියෝග, ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේදී ගුරුවරුන්ගේ භූමිකාව ආදී කරුණු පිළිබඳ විෂය කරුණු ඔස්සේ දැනුවත් කිරීම සිදුකළ යුතුය. මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරීන්ගේ සම්පත්දායකත්වය සහ බාහිර සම්පත්දායකත්වය ලබාගත යුතුය.පාසලකට අවම වශයෙන් එක් වර්ෂයකදී එක් වැඩසටහනක් කලයුතුය. වර්ෂයක් තුළ, පාසලේ සියලුම ගුරුභවතුන් ආවරණය වන පරිදි ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම ලබාදීම කලයුතුය.

**7. ''ශිෂ්‍ය තානාපති සඟරාව'' සඳහා නිර්මාණ සැපයීම**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන ශිෂ්‍ය තානාපති සඟරාව සඳහා නිර්මාණ යොමුකිරීම සඳහා ශිෂ්‍ය තානාපති වැඩසටහනට ලියාපදිංචි වූ සහ නොවූ පාසල් සඳහා මෙම අවස්ථාව ලබාදේ. ශිෂ්‍ය නායක/නායිකාවන්, ශිෂ්‍ය තානාපතිවරු, විදුහල්පති සහ ගුරුවරුන් හට මෙම සඟරාව සඳහා නිර්මාණ යොමුකිරීමට අවස්ථාව සලසනු ලැබේ. මෙම නිර්මාණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් වාර්ෂිකව ලබා දෙන උපදෙස් මත සකස් කලයුතුය. මේ පිළිබඳ තොරතුරු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය වන www.childprotection.gov.lk වෙත පිවිසීමෙන් ලබාගත හැක.

**8. පාසල් ළමා ආරක්ෂක කමිටුව පිහිටුවීම සහ පවත්වාගෙන යාම**

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේ අංක 17 දරන "සුරකුම් පව්ව" චක්‍රලේඛය ප්‍රකාරව සහ අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වරින්වර නිකුත්කරන ලද උපදෙස් මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය. ශිෂ්‍ය තානාපති වැඩසටහන සඳහා ලියාපදිංචිවූ පාසල් වල පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවා නැතිනම් ඒ සඳහා අවශ්‍ය කටයුතු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් සමග එක්ව කඩිනමින් සිදු කරන්න. මෙම කමිටුව සක්‍රිය මට්ටමින් පවත්වාගැනීමට සහ පාසලේ ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පාසල් ශිෂ්‍ය තානාපතීන්ගේ සහය ලබාගැනීමට කටයුතු කරන්න.

**9. ළමා ආරක්ෂාව පිළිබඳ දෙමාපිය සම්මන්ත්‍රණය / වැඩමුළුව / දැනුවත්කිරීමේ වැඩසටහන**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යනු කුමක්ද හා ඉන් සිදුවන සේවාව , ළමයින්ට බලපාන නීති, වර්තමාන ළමුන් මුහුණ දෙන ගැටළු සහ අභියෝග, ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේදී දෙමව්පියන්ගේ භූමිකාව , ධනාත්මක ශික්ෂණයේ ඇති වටිනාකම ආදී කරුණු පිළිබඳ විෂය කරුණු ඔස්සේ දැනුවත් කිරීම සිදුකළ යුතුය. මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්,දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරීන්ගේ සම්පත්දායකත්වය සහ බාහිර සම්පත්දායකත්වය ලබාගත යුතුය.පාසලකට අවම වශයෙන් එක් වර්ෂයකදී එක් වැඩසටහනක් කලයුතුය.

**10.මනෝ සමාජයීය, උපදේශන වැඩමුළුව / සම්මන්ත්‍රණ පැවැත්වීම**

ශිෂ්‍ය නායකයින්, පන්ති නායකයින් ලෙස සමවයස් කණ්ඩායම් සමග සමාජානුයෝජනයේදී යහපත් පෞර්ෂයකින් යුතුව නායකත්වයදීම සඳහා මනෝ සමාජීය සහාය ලබාදීම සහ උපදේශනය ලබාදීම මේතුළින් අපේක්ෂා කෙරේ.

ළමුන් මුහුණ දෙන ගැටළු සඳහා පිළියම් වශයෙන් මනෝ සමාජීය / උපදේශන වැඩමුළු හා සම්මන්ත්‍රණ සැලසුම් කළයුතු අතර ශිෂ්‍ය තානාපතිවරු 5 දෙනා විසින් පාසල තුළ අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම සිදුකල යුතුය. විදුහල්පතිතුමා / තුමියගේ අනුමැතිය සහ ශිෂ්‍ය නායක මණ්ඩලභාර ගුරුභවතුන්ගේ සහ උපදේශන ගුරුවරුන්ගේ උපදෙස් ලබාගතයුතුය. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරීන්ගේ සහ අවශ්‍ය විටදී බාහිර සම්පත්දායකත්වය ලබාගත යුතුය. මෙය අදියර 4ක් යටත් පැවැත්වීම කළයුතු අතර අවශ්‍ය අවස්ථාවන් වලදී විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපතිවරුන්ගේ සහාය ලබාගත හැක.

1. පළමු අදියර - ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය ඇතුළු 9 වන ශ්‍රේණිය සහ ඉන් ඉහළ සියලුම ශිෂ්‍ය නායකයන් සඳහා උපදේශන සැසියක් පැවැත්වීම
2. දෙවන අදියර - පන්ති නායක නායිකාවන් සඳහා උපදේශන සැසි පැවැත්වීම
3. තෙවන අදියර - සුදුසු පරිදි අනෙකුත් ශිෂ්‍යන් සඳහා උපදේශන සැසි පැවැත්වීම
4. සිව්වන අදියර - පාසල් ගුරුභවතුන් සහ කාර්ය මණ්ඩලය සඳහා මනෝ සමාජීය/ උපදේශන වැඩමුළුව / සම්මන්ත්‍රණය පැවැත්වීම

මෙහිදී ළමන් තුළ බහුලව දක්නට ඇති අවේගශීලී බව, ප්‍රචණ්ඩත්වය, අන් මතය නොඉවසීම ආදී චර්යාත්මක ගැටළු පිටුපස සැඟව ඇති මානසික සංවර්ධනයේ අඩුලුහුඩුකම් හඳුනාගෙන විනයගරුක ළමා පරපුරක් ඇතිකිරීමට අවශ්‍ය මනෝ සමාජීය සහාය ලබාදීමට කටයුතු කළ යුතුය.

**11.** **වාර්ෂික ‘‘පාසල් ළමා ආරක්ෂක දිනය’’ පැවැත්වීම**

ශිෂ්‍ය තානාපතිවරුන් සහ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය විසින් පාසල් ළමා ආරක්ෂක කමිටු සාමාජිකයන් සමග එක්ව පාසල් ළමා ආරක්ෂක දිනය සැලසුම් කර (විදුහල්පතිතුමාගේ / තුමියගේ ලිඛිත අනුමැතිය ලබාගෙන) ශිෂ්‍ය නායක මණ්ඩලභාර ගුරුභවතුන්ගේ නිර්දේශ මත සිදුකලයුතුය. පාසල් ළමා ආරක්ෂක දිනය ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් සහ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තු නිලධාරීන් සම්බන්ධ කරගනිමින් සිදුකල යුතුය. මෙහිදී විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපතිවරුන්ගේ සහාය ලබාගත හැකිය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් අදාල වර්ෂයේදී ලබා දෙන උපදෙස් මත මෙම වැඩසටහන සිදුකළ යුතුය.

මෙහිදී පාසලක් ලෙස ශිෂ්‍ය තානාපති වැඩසටහන යටතේ හඳුනාගනු ලැබූ ළමා ආරක්ෂාව ගිලිහී යාමට තුඩු දෙන අවදානම් සාධක,පාසලේ සිසුන් වෙත එම අවදානම් සහ ගැටළු බලපා ඇති ආකාරය,එවැනි අවස්ථාවක ගුරුවරුන්ගේ, දෙමාපියන්ගේ වගකීම, මෙම තත්වයන් හමුවේ සහාය ලබාගත හැකි රාජ්‍ය ආයතන වල නිලධාරීන්ගේ මැදිහත්වීම ආදිය පිළිබඳව දැනුවත් කළ හැක. නිර්මාණශීලී ලෙස විවිධ අංග ඇසුරින් (වේදිකා නාට්‍ය, ගීත, නැටුම්, චිරිඳු, විවාද ආදී) විවිධ නිර්මාණාත්මක වැඩසටහන් සමගින් ළමා ආරක්ෂක දිනය පැවැත්විය යුතුය.

**12.** **ළමා ආරක්ෂාව සම්බන්ධ පර්යේෂණ වාර්තාව**

ළමා ආරක්ෂාව ,ළමා අයිතිවාසිකම් , ළමා අපයෝජන හෝ ළමයින්ට අදාල ගැටළු පිළිබඳ තෝරාගත් මාතෘකාවක් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායකයන් විසින් සාකච්ඡාකොට ශිෂ්‍ය නායක මණ්ඩලභාර ගුරුවරුන් හා විදුහල්පතිගේ අනුමැතිය ලබාගතයුතුය.උදා: පාසල් ශිෂ්‍ය නායකයන් සාමූහිකව තම පාසලේ ළමුන්/ ළමයෙකුගේ හඳුනාගත් අවදානම් සාධකයක් සම්බන්ධව සිදුකළ හැකි පර්යේෂණයක් අනන්‍යතාවය / පුද්ගලිකත්වයට බාධාවක් නොවන පරිදි ඉදිරිපත් කිරීම හෝ පාසල පිහිටි ප්‍රදේශය / පරිසරය තුළ ඇති ළමා ආරක්ෂාවට ඇති තර්ජන /අවදානම් පිළිබඳ පර්යේෂණයක්.

පාසල් මට්ටමින් මෙම පර්යේෂණය සිදුකළ යුතුය. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සහය මේ සඳහා අවශ්‍ය සැම විටෙකදීම ලබාගත හැක. විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපති වැඩසටහන යටතේ පාසලට අනියුක්ත කරන ලද විශ්ව විද්‍යාල සිසුන් ගෙන් මේ සඳහා අමතර සහය ලබා ගත හැක.

## 13. ශිෂ්‍ය නායකයින් සහ ශිෂ්‍ය නායකයන් භාර ගුරුභවතුන් විසින් මොඩියුල 5 සම්පූර්ණ කිරීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් දෙනු ලබන උපදෙස් මත මෙම මොඩියුල 5 සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. මෙහිදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනය සමග ඒකාබද්ධව උපදෙස් ලබා දෙනු ලැබේ.

- **මොඩියුල අංක 1 - ළමා අයිතිවාසිකම් සහ ළමා ආරක්ෂාව**
- **මොඩියුල අංක 2 - නායකත්වය , කළමණාකරණය සහ ඉලක්ක ගොඩනැගීම**
- **මොඩියුල අංක 3 - සන්නිවේදනය සහ මහජන සම්බන්ධතා**
- **මොඩියුල අංක 4 - ජීවන නිපුණතා සංවර්ධනය**
- **මොඩියුල අංක 5 - පාසල තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ ප්‍රායෝගික කණ්ඩායම් ව්‍යාපෘතිය**

## 14. "ළමා ආරක්ෂාව පිළිබඳ පාසල් පාදක අවදානම් ලේඛණය සැකසීම (School Based Child Protection Risk Registry)"

පාසල් පාදක අවදානම් ලේඛණය සැකසීම සඳහා වාර්ෂිකව ශිෂ්‍ය නායකයින් 10 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් විදුහල්පතිවරයා/වරිය ඇතුළු ගුරුවරුන් විසින් නම්කල යුතුය. එම කණ්ඩායම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් සමග එක්ව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ලබාදෙන උපදෙස් අනුව අවදානම් ලේඛණය සැකසීම සඳහා අවශ්‍ය කටයුතු කලයුතුය.

පන්තිභාර ගුරුවරයා/වරිය විසින් එක් එක් පන්තියෙහි අනිවාර්යය අධ්‍යාපනය සහ/ ළමා ආරක්ෂාව සම්බන්ධ අවදානම් සහගත සිසුන්ගේ රහස්‍ය ලේඛණයක් පවත්වාගෙන යායුතුය. එම ලේඛණය ශ්‍රේණිභාර ගුරුවරයා / ගුරුවරිය විසින් විදුහල්පතිවරයා/වරියට ලබාදිය යුතුය. තෝරා ගන්නා ලද ශිෂ්‍ය නායකයන් 10 දෙනා සහ ශිෂ්‍ය නායක මණ්ඩලභාර ගුරුවරයා/ගුරුවරිය විසින් අවසන් ලේඛණය සකසා වාර්ෂිකව යාවත්කාලීන කර තම නිර්දේශ සහිතව විදුහල්පතිගේ අනුමැතියෙන් යුතුව මෙම ප්‍රධාන ලේඛණය පවත්වාගෙන යායුතුය.

**උදා : පාසල් හැරයාමේ අවදානම හා ඉගෙනුම් දුර්වලතා යනාදිය**

### 14.1. ළමා ආරක්ෂාව පිළිබඳ පාසල් පාදක අවදානම් ලේඛණය පවත්වාගෙන යාම සහ හඳුනාගන්නා ගැටළු සඳහා පිළියම් යෙදීම.

විදුහල්පති තුමා/ තුමිය විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන් හා එක්ව කඩිනමින් විසඳුම් සෙවීමට ක්‍රියාත්මක විය යුතුය.

**15. ශිෂ්‍ය තානාපති වාර්ෂික වාර්තාව**

ශිෂ්‍ය තානාපති වාර්ෂික වාර්තාව සඳහා ශිෂ්‍ය තානාපති වැඩසටහනට අදාලව පාසල තුළ කරන ලද වැඩසටහන් ඇතුලත් කර වාර්තාවක් සකස් කරන්න. ( විශේෂ අවස්ථා පිළිබඳව සහ පාසල් ශිෂ්‍ය නායකයින් ළමා ආරක්ෂාව පිළිබඳ තානාපතිවරුන් ලෙස ඔවුන්ගේ දායකත්වය,වැඩසටහනේ ඡායාරූප, මෙම වැඩසටහනෙහි අරමුණු ක්‍රියාකාරකම් සඳහා ලබාදීමේදී, ඔවුන් මුහුණ දුන් අභියෝග, ලබාගත් දැනුම, කුසලතා වර්ධනය, නායකත්ව පුහුණුව ආදිය ඇතුළත්ව)

විදුහල්පතිගේ සහ ශිෂ්‍ය නායක මණ්ඩලභාර ගුරුභවතුන්ගේ උපදෙස් අනුව ශිෂ්‍ය තානාපතිවරු විසින් වාර්ෂික වාර්තාව සකසා සෑම වර්ෂයකදීම සැප්තැම්බර් 30 වන දින වන විට ඔබ පාසලේ වෙබ් අඩවියක් ඇත් නම් එහි පලකල යුතුය. ඊට අමතරව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රාදේශිය / දිස්ත්‍රික් නිලධාරියා වෙත දෘඩ පිටපතක් භාරදීම කලයුතුය. (මෙහිදී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ අත්සන සහිතව එම වාර්තාව භාරදිය යුතුය)

උදයකුමාර අමරසිංහ
සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය